[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 08 ශ්‍රේණිය | විද්‍යාව | පත්‍රය I/II | පැය - 2 යි. |
|---|---|---|---|

නම ...........................................................................................................................................................

**සැළකිය යුතුයි.**

- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**
- **1 සිට 20 දක්වා ප්‍රශ්නය සඳහා නිවැරදි හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01). මුල් වරට ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණය කරන ලද්දේ,

1). සර් අයිසැක් නිව්ටන් 2). ඇන්ටන් වෑන් ලීවන්හුක්
3). කැරොලස් ලිනේයස් 4). චාල්ස් ඩාවින්

02). ව්‍යාජ පාද දරණ ක්ෂුද්‍ර ජීවියා වන්නේ,

1). පැරමීසියම් 2). යීස්ට්
3). ඇමීබා 4). ක්ලැමිඩමොනාස්

03). අපෘෂ්ඨවංශී කාණ්ඩයක් වන නිඩාරියා කාණ්ඩයට අයත් නොවන ජීවියෙක් වන්නේ,

1). හයිඩ්‍රා 2). ලොඩියන්
3). මුහුදු මල 4). කූඩැල්ලා

04). සත්ත්වයෙකුගේ මුඛයේ දත් නොපිහිටන අතර භෝජන රටාව අනුව සැකසුන හොටක් පවතී. මෙම පෘෂ්ඨවංශී කාණ්ඩය වනුයේ,

1). අවේස් කාණ්ඩය 2). රෙප්ටීලියා කාණ්ඩය
3). පිස්කේස් කාණ්ඩය 4). මැමේලියා කාණ්ඩය

05). පත්‍රවල ප්‍රධාන කෘත්‍ය වනුයේ,

1). ප්‍රරෝහණය සිදු කිරීම 2). වායු හුවමාරුව සිදු කිරීම
3). ප්‍රභාසංශ්ලේශණය කිරීම 4). ජලය අවශෝෂණය කර ගැනීම

06). කරු මුල් සහිත ශාකයක් වනුයේ,

1). රම්පෙ 2). නුග
3). ඕකිඩ් 4). කිරල

07). මූල ද්‍රව්‍යයක් නොවන්නේ,

1). නයිට්‍රජන් 2). ජලය
3). ඇලුමිනියම් 4). කොපර්

08). කම්පන සංඛ්‍යාතය මනින අන්තර් ජාතික ඒකකය වන්නේ,

1). N 2). kg
3). $ms^{-1}$ 4). $H_z$

09). A හා B හි සංඛ්‍යාත පිළිබඳව කිව හැක්කේ,




1). A හා B සංඛ්‍යාත සමාන වේ.
2). A හි සංඛ්‍යාතය වැඩි අතර B හි සංඛ්‍යාතය අඩු වේ.
3). B හි සංඛයාතය වැඩි අතර A හි සංඛ්‍යාතය අඩු වේ.
4). A හා B දෙකෙහිම සංඛ්‍යාත පිළිබඳ කිව නොහැක.

10). යකඩ ඇණයක්, මකන කෑල්ලක්, මිනිරන් කූරක්, ලී කැබැල්ලක්, යෝගට් හැන්දක් A, B අතරට තැබූ විට බල්බය දැල්වෙන්නේ කුමන ද්‍රව්‍ය තැබූ විටද?




1). යකඩ ඇණය, මකන කෑල්ල
2). යකඩ ඇණය, මිනිරන් කූර
3). මිනිරන් කූර, ලී කැබැල්ල
4). ලී කැබැල්ල, යෝගට් හැන්ද

11). එදිනෙදා ජීවිතයේ දී අපට හමුවන විපර්යාස භෞතික විපර්යාස හා රසායනික විපර්යාස ලෙස වර්ග දෙකකට බෙදිය හැක. පහත විපර්යාස අතුරින් භෞතික විපර්යාසයක් නොවන්නේ,

1). ඝන ඉටි ද්‍රව වීම. 2). අයිස් ද්‍රව වීම
3). යකඩ මල බැඳීම 4). ජලය වාෂ්ප වීම

12). මිනිසාගේ නයිට්‍රජනීය බහිස්‍රාවීය පද්ධතිය ලෙස සැලකෙනුයේ මුත්‍ර වාහිනී පද්ධතියයි. මෙම පද්ධතියෙන් නිපදවෙන මුත්‍රවල අඩංගු සංඝටකයක් නොවන්නේ,

1). ලවණ වර්ග 2). යූරියා
3). රුධිර සෛල 4). යූරික් අම්ලය

13).  මෙම සංකේතයෙන් දැක්වෙන්නේ,

1). ආලෝක සංවේදී ප්‍රතිරෝධකයකි 2). ආලෝක විමෝචක ඩයෝඩයකි
3). ධාරා නියාමයකි 4). ස්ථිර ප්‍රතිරෝධකයකි

14). පරිපථයක් තුලින් ගලායන ධාරාව මැනීම සඳහා භාවිතා කරනුයේ,

1). ගැල්වනෝ මීටරය 2). ඇමීටරය
3). වෝල්ට් මීටරය 4). බැරෝ මීටරය

15). මැග්නීසියම් පටියක් වාතයේ දහනය කළ විට දීප්තිමත්ව දැවී සුදු කුඩක් ඉතිරි වේ. ඉතිරි වන මෙම සුදු කුඩෙහි අඩංගු වන්නේ,

1). මැග්නීසියම් ඔක්සයිඩ් 2). මැග්නීසියම් නයිට්‍රේට්
3). මැග්නීසියම් හයිඩ්‍රොක්සයිඩ් 4). මැග්නීසියම් ක්ලෝරයිඩ්

16). කුඩා බලයක් යෙදූ විට කුඩු වී යාම හඳුන්වනු ලබන්නේ,

1). තන්‍යතාව ලෙස ය. 2). දෘඩතාව ලෙස ය.
3). ප්‍රත්‍යස්ථතාව ලෙස ය. 4). භංගුරතාව ලෙස ය.

17). විදුලිය ගමන් කරන ද්‍රවමය ලෝහමය ද්‍රව්‍ය වන්නේ,

1). ජලය 2). රසදිය 3). මධ්‍යසාර 4). වයින් ස්ප්‍රීතු

18). මින් අසත්‍ය ප්‍රකාශය කවරෙක්ද?

1). දහනය රසායනික ප්‍රතික්‍රියාවකි.
2). පූර්ණ දහනය නිසා සෑදෙන්නේ නිල් පාට දැල්ලකි.
3). දහනය සඳහා කාබන්ඩයොක්සයිඩ් වායුව අවශ්‍ය වේ.
4). යමක් දහනය සඳහා එහි ජ්වලනාංකය දක්වා රත් වීම අවශ්‍ය වේ.

19). කැල්සියම් කාබනේට් සංයෝගයෙහි අඩංගු මූල ද්‍රව්‍ය වන්නේ,

1). කැල්සියම්, කාබන්, ඔක්සිජන්
2). කාබන්, ඔක්සිජන්, ක්ලෝරීන්
3). කැල්සියම්, ක්ලෝරීන්, කාබන්
4). කාබන්, සල්ෆර්, කොපර්

20). සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයකට පිනොප්තලීන් දමා වැඩිපුර හයිඩ්‍රොක්ලෝරික් අම්ලය එක් කල විට,

1). රෝස පාට රතු පාටට හැරේ  2). රතු පාට රෝස පාට වේ.
3). රෝස පාට අවර්ණ වේ.  4). වර්ණ විපර්යාසයක් දැකිය නොහැක.

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර, පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01. A) පිරිසිදු වීදුරුවකට පොල් වතුර දමා දින කිහිපයක් එය වාතයට විවෘතව තබන ලදි.

i). දින තුනකට පමණ පසුව මෙම ක්‍රියාකාරකමේ නිරීක්ෂණයක් ලියන්න.
ii). මෙම පොල් වතුර වල ක්ෂුද්‍ර ජීවීන් සිටීදැයි ඔබ පරීක්ෂා කලේ කෙසේද? (ල : 01)
iii). මෙම පරීක්ෂාවේ දී ප්‍රමුඛව දක්නට ලැබෙන ජීවීන් නම් කරන්න. (ල : 02)
iv). ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය ප්‍රයෝජනවත් ලෙස යොදා ගන්නා නිෂ්පාදන 04 ක් නම් කරන්න. (ල : 02)
v). ක්ෂුද්‍ර ජීවීන්ගේ වර්ධනය සඳහා හිතකර සාධක 02 ක් ලියන්න. (ල : 02)

B) මිනිස් සිරුරේ සමායෝජනය සිදුවීම සඳහා ස්නායු හා හෝර්මෝන වල සහභාගීත්වය වැදගත් වේ. ස්නායු පද්ධතිය මැදිහත් වීමෙන් සිදු කෙරෙන සමායෝජනය ස්නායුක සමායෝජනයයි.

i). පහත දැක්වෙන සටහනේ හිස්තැන් සම්පූර්ණ කරන්න.




(ල : 03)

ii). පහත දැක්වෙන්නේ මානව මධ්‍ය ස්නායු පද්ධතියයි. මෙහි a,b,c කොටස් නම් කරන්න. (ල : 03)
iii). b මගින් කෙරෙන කාර්යය ලියන්න. (ල : 01)
iv). ස්නායු ආවේගයක් යන්න යනු හඳුන්වන්න. (ල : 01)



02. A) නිවැරදි පිළිතුර දක්වමින් වගුව සම්පූර්ණ කරන්න.

| සත්ත්වයා | අයත් කාණ්ඩය | කාණ්ඩයේ සුවිශේෂී ලක්ෂණ |
|---|---|---|
| a. කුඩැල්ලා | i. ...................... | • සිහින් දිග පණු ආකාරවේ. සඛණ්ඩ පනුවන් ලෙස හඳුන්වයි. |
| b. ii.................... | නිඩාරියා | • දේහය අරීය සමමිතික වේ. බුහුබා සහ මෙඩුසා ආකාර දරයි. |
| c. iii.................... | ආත්‍රොප්‍රෝඩා | • සන්ධිපාදකයින් වේ. දේහය මතුපිට බාහිර සැකිල්ලක් වේ. |
| d. iv.................... | v ..................... | • පේශිමය පාදයක් සහිතය. මෘදු වංශීන් ලෙස හඳුන්වයි. |

(ල : 05)

B) A තීරයේ ඇති ලක්ෂණ වලට සුදුසු පිළිතුර B තීරුවෙන් තෝරා ඊට අදාළ **අක්ෂරය** වරහන් තුල යොදන්න.

| | | | | |
|---|---|---|---|---|
| i). | ශාකපත්‍ර වල පුටිකා හරහා වායුගෝලයට ජල වාෂ්ප පිට වීම. | ( ) | a). | භූගත කඳන් |
| ii). | සමහර ශාකවල කඳන් පසතුල පිහිටයි. | ( ) | b). | පත්‍ර වින්‍යාසය |
| iii). | ආහාර තැන්පත් වීම නිසා විශාල වී ඇති මුල් | ( ) | c). | ප්‍රභාසංශ්ලේෂණය |
| iv). | පත්‍රවල ප්‍රධාන කෘත්‍ය වනුයේ | ( ) | d). | වායු ධර මුල් |
| v). | ශාක පත්‍ර කඳට සවි වී ඇති රටාව | ( ) | e). | උත්ස්වේදනය |
| vi). | වායු ගෝලීය වාතය අවශෝෂණය කරයි. | ( ) | f). | ආකන්දී මුල් |

(ල : 06)

03. A) ඝනයක් ද්‍රවයක් බවට පත්වන නිශ්චිත උෂ්ණත්වය එම ද්‍රව්‍යයේ ද්‍රවාංකය වේ.
අයිස් වල ද්‍රවාංකය සෙවීම සඳහා ඔබ පාසල් විද්‍යාගාරයේ දී කල ක්‍රියාකාරකමක ඇටවුමක් පහත දැක්වේ.




i). a, b, c, හා d ලෙස යොදා ගත් උපකරණ නම් කරන්න. (ල : 02)

ii). a හා b මෙම ක්‍රියාකාරකම සඳහා ප්‍රයෝජනවත් වූයේ කෙසේද? (ල : 02)

iii). c ද්‍රව්‍යය කිසියම් කාලයක් එලෙසම තබා ගැනීමට අවශ්‍යනම් ඔබ යෙදූ උපක්‍රමය කුමක්ද? (ල : 02)

B) වරහන තුල ඇති හිස්තැන් පුරවන්න.
(චුම්බක ක්ෂේත්‍රය, ෆෙරයිට්, මෘදු යකඩ, විකර්ෂණය, භූ චුම්බකත්වය)

i). චුම්භකයක් අවට චුම්භක බලය රදා පවතින ප්‍රදේශය................................................ලෙස හැඳින්වේ.

ii). චුම්භක වල සජාතීය ධ්‍රැව............................................වේ.

iii). ස්ථිර චුම්භක තැනීමට....................................................භාවිතා කෙරේ.

iv). තාවකාලික චුම්භක තැනීමට........................................භාවිතා කෙරේ.

v). පෘථිවිය අසල පවතින චුම්භක බලය ..........................................ලෙස හැඳින්වේ.

(ල : 05)

04. A) දහනය කිරීමෙන් තාප ශක්තිය හා ආලෝක ශක්තිය ලබා ගැනීමට භාවිතා කරන ද්‍රව්‍ය ඉන්ධන නම් වේ.

i). ඝන ඉන්ධන සඳහා උදාහරණ 02ක් ලියන්න. (ල : 01)

ii). සෑම ඉන්ධනයකම අඩංගු වන මූල ද්‍රව්‍ය 2ක් නම් කරන්න. (ල : 01)

iii). ඉන්ධන දහනයේ දී නිපදවන ඵල හඳුනා ගැනීමට ඔබ කළ ක්‍රියාකාරකමක් පහත දැක්වේ.




a) නිර්ජලීය කොපර්සල්ෆේට් යොදා ගත්තේ ඇයි ........................................ (ල : 01)

b) බෝතලයට අවර්ණ හුණු දියර යෙදීමේ අරමුණ කුමක්ද?........................................ (ල : 01)

c) වීදුරු පුනීලය තරමක් ඉහලින් තැබීමට හේතුව කුමක්ද?.................................. (ල : 01)

d) මෙම ක්‍රියාකාරකමෙන් ලබා ගත හැකි නිගමන මොනවාද? (ල : 02)

B) විවිධ ද්‍රව්‍ය විවිධ භෞතික ගුණ වලින් යුක්ත වේ.

i). පදාර්ථය සතු භෞතික ගුණ 2ක් ලියන්න. (ල : 01)

ii). කම්බි කූරට අල්පෙනෙති සවි කර ගන්නේ කෙසේ ද? (ල : 01)




iii). ක්‍රියාකාරකම කළ විට ලැබෙන නිරීක්ෂණය ලියන්න. (ල : 01)

iv). මෙයින් ලැබෙන නිගමනය කුමක්ද? (ල : 01)

05. A) එදිනෙදා භාවිත කරන ශක්ති ප්‍රභේද අතුරින් විද්‍යුතයට හිමි වනුයේ ප්‍රධාන ස්ථානයකි.

i). විද්‍යුත් ධාරාවක් යනු කුමක් ද? (ල : 01)

ii). මෙම පාඩමේ දී ඔබ කල ක්‍රියාකාරකමක් සඳහා ගුරුතුමිය විසින් වියළි කෝෂ දෙකක්, විදුලි පන්දම් බල්බයක්, ස්විචයක්, සම්බන්ධක කම්බි සැපයූ යේ නම් මෙම ද්‍රව්‍ය යොදා ගනිමින් සෑදිය හැකි සංවෘත පරිපථය සංකේත යොදා ගනිමින් අඳින්න. (ල : 02)

iii). මෙවැනි පරිපථයක විදුලිය ගලන දිශාව හඳුනා ගැනීම සඳහා මෙම පරිපථයට සම්බන්ධ කළ යුතු උපකරණය කුමක්ද? (ල : 01)

iv). මෙම පරිපථය තුලින් ගලන ධාරාව මැන ගැනීම සඳහා යොදා ගන්නා උපකරණය කුමක්ද? (ල : 01)

v). මෙම පාඩමේ දී ඔබ වෝල්ට් මීටරය යොදා ගන්නේ පරිපථයේ කුමන මිනුමක් ලබා ගැනීම සඳහාද? (ල : 02)

vi). එම උපකරණය පහත පරිපථයට සම්බන්ධ කරන්නේ ශ්‍රේණිගතවද සමාන්තරගතවද? (ල : 01)

vii). වියලි කෝෂ දෙකක් ශ්‍රේණිගතව හා බල්බ තුනක් සමාන්තර ගතව සම්බන්ධ කරන අයුරු සටහනකින් දක්වන්න.(සංකේත යොදා ගන්න.) (ල : 03)

06. A) යම් පදාර්ථයක සංයුතිය වෙනස් වී නව ද්‍රව්‍ය සෑදීමක් සිදු වන අන්දමේ විපර්යාස රසායනික විපර්යාස ලෙස හැඳින්වේ.

i).




(ල : 03)

ඉහත ක්‍රියාකාරකම අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රතික්‍රියාව | නව ද්‍රව්‍ය සෑදුන බවට නිරීක්ෂණ |
|---|---|
| a | i……………., ii…………………….. |
| b | iii……………., iv…………………….. |
| c | v……………., vi…………………….. |

(ල : 03)

ii). ස්කන්ධ සංස්ථිති නියමය ලියන්න. (ල : 02)




iii). ඉහත ක්‍රියාකාරකම මගින් ස්කන්ධ සංස්ථිති නියමය පෙන්වා දිය හැක. මෙහි a ලෙස නම් කර ඇති ද්‍රව්‍ය කුමක් ද? (ල : 01)

iv). ඒවා යටිකුරුව දැමීමට හේතුව ලියන්න. (ල : 01)

v). මෙම ක්‍රියාකාරකමේ දී නලයේ පතුල සමීපයෙන් රත් කරනු ලැබේ. දක්නට ලැබුන නිරීක්ෂණ 02 ක් ලියන්න. (ල : 02)

vi). මෙම ක්‍රියාකාරකමේ දී කැකෑරුම් නලය රත් කිරීමට පෙර හා පසු ස්කන්ධ පිළිබඳ ඔබට කුමක් කිව හැකිද? (ල : 02)

07. A) පොදු ගති ලක්ෂණ වලට අනුව සතුන් කාණ්ඩ වලට වෙන් කිරීම. සත්ත්ව වර්ගීකරණය ලෙස හැඳින්වේ.

i). සතුන් බෙදිය හැකිය ප්‍රධාන කාණ්ඩ 02ක් ලියන්න. (කොඳු ඇට පෙළ පදනම් කර ගනිමින්) (ල : 02)

ii). කොඳු ඇට පෙලක් සහිත සතුන් බෙදිය හැකි කාණ්ඩ මොනවාද? (ල : 03)

iii). ජීවන චක්‍රයේ එක් අවධියක් ජලජ පරිසරයේ ගත කරන ශ්වසනය පෙනහැලි, තෙත සම හෝ මුඛය මගින් සිදු කරන සත්ත්ව කාණ්ඩය කුමක්ද? (ල : 01)

B)




(ල : 01)

i). රූපයේ a, b, හා c, d කොටස් නම් කරන්න. (ල : 02)

ii). උත්ස්වේදනය අවම කිරීමට ශාක දක්වන අනුවර්තන 2ක් ලියන්න. (ල : 02)

iii). පත්‍ර තුල ජලය ගබඩා කර තබා ගන්නා ශාක 2ක් ලියන්න. (ල : 02)

# 2023 – 8 ශ්‍රේණිය (දෙවන වාරය)

## විද්‍යාව පිළිතුරු පත්‍රය I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1) | 2 | 6) | 2 | 11) | 3 | 16) | 4 |
| 2) | 3 | 7) | 2 | 12) | 3 | 17) | 2 |
| 3) | 4 | 8) | 4 | 13) | 2 | 18) | 3 |
| 4) | 1 | 9) | 3 | 14) | 2 | 19) | 1 |
| 5) | 3 | 10) | 2 | 15) | 1 | 20) | 3 |

## විද්‍යාව පිළිතුරු පත්‍රය II

01. A). i පොල් වතුර මත පෙන සෑදී තිබීම/ පිපිමකට ලක් වී තිබීම. (ල .1)

ii මෙම පොල් වතුර බිංදුවක් වීදුරු කදාවක් මත තබා අන්වීක්ෂයක් ආධාරයෙන් නිරීක්ෂණය කිරීම. (ල .2)

iii යීස්ට්/ yest (ල .1)

iv කිරි මිදවීම/ යෝගට් නිෂ්පාදනය/ චීස් නිෂපාදනය/ බේකරි ආහාර නිෂ්පාදනය/ ප්‍රතිජීවක ඖෂධන නිෂ්පාදනය ආදී සුදුසු නිෂ්පාදන 4 කට (ල .2)

v තෙතමනය හා උෂ්ණත්වය (ල .2)

B). i a) පර්යන්ත ස්නායු පද්ධතිය

b) සුෂුම්නාව

c) අනුමස්තිෂ්කය (ල .3)

ii a) මස්තිෂ්කය b) අනුමස්තිෂ්කය c) සුෂුම්නාව (ල .3)

iii
- දේහ සමතුලිතතාව පවත්වා ගැනීම.
- ඉච්ජානුග පේශි ක්‍රියාකාරීත්වය පාලනය කිරීම. (ල .1)
- දේහයේ චලන නිසියාකාරව සිදු කිරීමට දායක වීම. (ල .1)

iv හඳුන්වා දීමට

02. A). i). ඇනෙලිඩා

ii). හයිඩ්‍රා/ මුහුදු මල/ ලොඩියා

iii). සමනලයා/ පත්තෑයා/ මකුළුවා/ ගෝනුස්සා/ කැරපොත්තා ආදී

iv). ගොළුබෙල්ලා/ හංගොල්ලා/ දැල්ලා/ බූවල්ලා ආදී

v). මොලුස්කා (ල .5)

B) i. e iv. c

ii. a v. b

iii. f vi. d (ල .6)

03. A) i. a – ආධාරකය c – කැකෑරුම් නලය

b – මන්තය d – උෂ්ණත්ව මානය (ල .2)

ii. a - } අදාල පිළිතුරු සඳහා (ල .2)

b - (ල .2)

iii. ලී කුඩු තුල/ දහයියා තුල බහා තැබීම.

B) i. චුම්බක ක්ෂේත්‍රය iv. මෘදු යකඩ

ii. විකර්ෂණය v. භූ චමුබකත්වය (ල .5)

iii. ෆෙරයිට් (ල .1)

04. A) i. සුදුසු උදාහරණ දෙකක් සඳහා (ල .1)
ii. C, H, O අතරින් ඕනෑම දෙකකට (ල .1)
iii. a) ජලය තිබේදැයි හඳුනා ගැනීමට (ල .1)
b) $CO_2$ වායුව/ කාබන්ඩයොක්සයිඩ් වායුව පිටවන්නේ දැයි හඳුනා ගැනීමට. (ල .1)
c) දහනය සඳහා අවශ්‍ය ඔක්සිජන් වායුව ඉටිපන්දම් දැල්ල වෙත ලබා ගැනීමට (ල .1)

B) i. අදාල භෞතික ගුණ 2 කට
ii. ඉටි පන්දම් කිරි ආධාරයෙන්
iii. කම්බි කූර ඉටි පන්දමට ඇල්ලූ විට ටික වේලාවකින් ඉටිපන්දම් දැල්ල ඇති පැත්තේ සිට පිළිවෙලින් අල්පෙනෙති ගැල වී වැටීම ආදී පිළිතුරකට (ල .1)
iv. කම්බි කූර තාප සන්නායකය කරන බව (ල .1)

05. A) i. නිවැරදි පැහැදිලි කිරීමට (ල .1)
ii.



නිවැරදි රූපයට (ල. 02)

iii. ගැල්වනෝ මීටරයක් (ල .1)
iv. ඇමීටරය/ මිලි ඇමීටරය (ල .1)
v. විභව අන්තරය (ල .2)
vi. සමාන්තර ගතව (ල .1)
vii.



නිවැරදිව ඇඳ ඇති විට(ල. 03)

06. A) i. ද්‍රාවනයේ නිල් පැහැය ක්‍රමයෙන් අඩුවේ.
ii. දුඹුරු පැහැති කුඩක් නලය පතුලේ තැන්පත් වේ.
iii. වායු බුබුලු පිට වේ.
iv. සින්ක් කැබැල්ල ක්‍රමයෙන් ක්ෂය වේ.
v. සුදු පැහැති අවශේෂයක් ලැබේ
vi. සුදුසු පිළිතුරක් (ල .3)

B) i. නිවැරදි පිළිතුරට (ල .2)
ii. ගිනි කූර (ල .1)
iii. ගිනි කූරු හිස ඉක්මනින් තාපය ලබා ගනිමින් දහනය වීම සඳහා (ල .1)
iv. ගිනි කූරු දැල්වේ/ බැලූනය විශාල වේ. (ල .2)
v. රත් කිරීමට පෙර හා රත් කිරීමට පසු පද්ධතියේ ස්කන්ධය සමාන වේ. (ල .2)

07. A) i. පෘෂ්ඨවංශීන්/ අපෘෂ්ඨවංශීන්
ii. පිස්කේස්/ මත්ස්‍යයින් (ල .2)
ඇම්ෆිබියා/ උභය ජීවීන්
රෙප්ටීලියා/ උරගයින්
ආවේස්/ පක්ෂීන්
මැමේලියා/ ක්ෂීරපායින් (ල .3)
iii. ඇම්ෆිබියා/ උභය ජීවීන්

B) i. a) පත්‍ර වෘන්තය b) පත්‍ර නාරටි
c) පත්‍ර දාරය d) පත්‍ර අග්‍රය (ල .2)
ii. සුදුසු අනුවර්තන 02ක් සඳහා (ල .2)
iii. නිවැරදි ශාක දෙකක් සඳහා (ල .1)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න